**සාමාන්‍ය සමය තුන්වන ඉරුදින** | **දේව ප්‍රකාශන** | 22-01-12

## පළමුවන කියැවීම

ජෝනා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි. ජෝනා 3:1-5,10

**නිනිව්යේ වැසියෝ අදමිටු මගින් ඉවත් වූ හ.**

සමිඳුණන් වහන්සේගේ පණිවුඩය දෙවන වරට ජෝනා වෙත පැමිණියේ ය. "නුඹ නැගිට නිනිවය නම් ශ්‍රේෂ්ට නගරයට ගොස් මා නුඹට කියන පණිවුඩය එහි ප්‍රකාශ කරන්නැ"යි සමිඳුණන් වහන්සේ වදාළ සේක. එවිට ජෝනා නැගිට සමිඳුණන් වහන්සේ නියම කළ පරිදි නිනිවයට ගියේ ය. නිනිවය ඉතා විශාල නගරයකි. එය හරහා යාමට දවස් තුනක් ගතවේ. ජෝනා එක දවසක් ගමන් කර නගරයට ඇතුල් වී, "තව දින සතළිසකින් නිනිවය වැනසෙනු ඇතැ"යි මෙරගසා ප්‍රකාශ කළේ ය. නිනිවයේ වැසියෝ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කර, උපවාසයක් නියම කොට, ලොකු අය පටන් කුඩා අය දක්වා දළ රෙදි ඇඳ ගත්තෝ ය. දෙවියන් වහන්සේ ඔවුන් කළ දේත් ඔවුන් නපුරු මාර්ගයෙන් ඉවත් වූ අයුරුත් දැක ඔවුන්ට කරන්නට අදහස් කළ විපත ගැන සිත වෙනස් කර ගෙන එය නොකළ සේක.

දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 25:4-9

පිළිතුර: සමිඳුනි, ඔබ වහන්සේගේ මාවත් මට පැහැදිලි කළ මැනව.

ගීය: සමිඳුනි, ඔබේ ක්‍රියා මාර්ගය මට හෙළි කළ මැනව.
ඔබේ මාවත් මට පැහැදිලි කළ මැනව. ඔබේ සත්‍යය අනුව මා ගෙන ගිය මැනව. මට එය ඉගැන්නුව මැනව.

මන්ද ඔබ මාගේ විමුක්ති දායක දෙවිඳුණෝ ය. දවස පුරා ඔබ එන මග බලා සිටිමි. සමිඳුනි, ඔබේ කරුණා ගුණයත් තිර පෙමත් සිහි කළ මැනව. මේවා ඔබේ චිරාගත ගුණාංගයෝ ය. සමිඳුනි, ඔබේ යහපත්කම ද මහා කරුණාව ද අනුව මා සිහි කළ මැනව.

සමිඳුණෝ යහපත් ය. අවංක ය. එතුමාණෝ පව්ටුන් හට යා යුතු මාර්ගය උගන්වන සේක. එතුමාණෝ නිහතමානි අය යුක්තියෙහි හසුරුවන සේක. එතුමාණෝ යටහත් පහත් අයට තම මාර්ගය උගන්වන සේක.

## දෙවන කියැවීම

1කොරින්ති 7:29-31

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් කොරින්තවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**මේ ලෝකයේ රූපය පහ වී යන්නේ ය.**

සහෝදරවරුනි, මේ දේ කියනු කැමැත්තෙමි. එනම් වැඩි කාලයක් ඉතිරි වී නැත. මෙතැන් සිට භාර්යාවන් ඇත්තන් භාර්යාවන් නැත්තන් මෙන් ද, හඬන්නන් නොහඬන්නන් මෙන් ද, මිලයට ගන්නන් ගත් දෙයට අයිතියක් නැති අය මෙන් ද, මෙලොව සැප සම්පත් භුක්ති විඳින්නන් ඒවායේම ඇලී ගැලී නොසිටින්නන් මෙන් ද, සිටිය යුතු යයි මම ඔබට කියමි. මන්ද, දැන් පවතින මේ ලෝකය පහ වී යන්නේ ය.

දේව වාක්‍යය එසේ ය.

## සාධුකාරය

මාක් 1:15

ආලේලූයා! ආලේලූයා!

"දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය.

මනස්ථාපනය වන්න, සුබ අස්න අදහා ගන්නැ"යිසමිඳාණෝ වදාරණ සේක.

ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 1:14-20

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**මනස්ස්ථාපනය වන්න, ශුභාරංචිය කෙරෙහි විශ්වාස කරන්න.**

ජුවාම් හිර භාරයට ගනු ලැබූ පසු, ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ සුබ අස්න දේශනා කරමින් ගලීලයට වැඩිය සේක. ඒ දේශනාව මේ ය; "නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ; දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්න ය.මනස්ස්ථාපනය වන්න, සුබ අස්න අදහාගන්න" යනුයි. උන් වහන්සේ ගලීලයේ මුහුද අද්දර ඇවිදින විට සීමොන් ද ඔහුගේ සොහොයුරු ඇන්ඩෘ ද මුහුදෙහි දැලක් දමනු දුටු සේක. ඔව්හු මසුන් අල්ලන්නෝ වූ හ. ජේසුස් වහන්සේ ඒ දැක, "මා අනුව එන්න; මම ඔබ මිනිසුන් දිනාගන්නන් කරමි" යි වදාළ සේක. එකෙණෙහිම ඔව්හු දැල් හැරදමා උන් වහන්සේ අනුව ගියහ. උන් වහන්සේ එතැනින් මඳ දුරක් ගොස් සෙබදීගේ පුත් ජාකොබ් ද, ඔහුගේ සහෝදර ජුවාම් ද ඔරුවක හිඳ දැල් සකස් කරනු දැක, එකෙණෙහි ම ඔවුන් කැඳවා වදාළ සේක. ඔව්හු ද තම පිය සෙබදී මෙහෙකරුවන් සමඟ ඔරුවෙහි සිටිය දී ම උන් වහන්සේ අනුව ගියහ.

සුවිශේෂ වාක්‍යය එසේ ය.